සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **අංක 01 සිට 40 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01. උදෑසන අවදිවන විට රවිඳු ට හිසරදයක් දැනුන නිසා කාර්යාලයට නොයෑමට තීරණය කළේය. මෙබඳු අවස්ථාවක දක්නට ලැබෙන්නේ,
    (1) අන්තර් පුද්ගල සන්නිවේදනයයි. (2) අන්තර් වර්තී සන්නිවේදනයයි.
    (3) විධිමත් සන්නිවේදනයයි. (4) සමූහ සන්නිවේදනයයි.
02. සන්නිවේදනයේ ස්වභාවය හඳුන්වා දීමේ දී වඩාත් ගැලපෙන අදහස වන්නේ,
    (1) සන්නිවේදනය භාෂාව මත පදනම් වීමයි. (2) සන්නිවේදනය බාධක සහිත වීමයි.
    (3) සන්නිවේදනය ක්‍රියාවලියක් වීමයි. (4) සන්නිවේදනය ප්‍රතිචාර මත පැවතීමයි.
03. සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය හඳුන්වා දෙන ලද්දේ,
    (1) විල්බර් ශ්‍රාම් විසිනි. (2) ඩේවිඩ් කේ. බර්ලෝ විසිනි.
    (3) හැරල්ඩ් ලැස්වෙල් විසිනි. (4) ෂැනොන් හා වීවර් විසිනි.
04. ප්‍රවෘත්ති සාකච්ඡාවක් යනු,
    (1) ඒකමාර්ගික සන්නිවේදන අවස්ථාවකි. (2) දෙදෙනෙකු අතර කෙරෙන සාකච්ඡාවකි.
    (3) ද්වි මාර්ගික සන්නිවේදන අවස්ථාවකි. (4) තනි පුද්ගලයෙකු මෙහෙයවන රැස්වීමකි.
05. අක්ෂි සම්බන්ධතාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
    (1) රූපවාහිනිය දෙසම බලා සිටීමයි.
    (2) කෙනෙක් සමඟ කථා කිරීමේදී ඒ පුද්ගලයා දෙස ඇස් යොමුකිරීමයි.
    (3) පොත් කියවීමේ දී සිදුවන අක්ෂිවල ක්‍රියාකාරිත්වයයි.
    (4) නිරන්තරයෙන් අක්ෂිවල පවත්නා දෝෂ සහගත බවයි.
06. උත්තේජන ප්‍රතිචාර ක්‍රියාවලියට වඩාත් අදාළ වන්නේ,
    (1) ඇස, කන, දිව, නාසය හා ශරීරය යි.
    (2) මුහුණ, කට, අත්, පාද හා හිස යි.
    (3) මොළය, ඇස, කන, නාසය හා ශරීරය යි.
    (4) ගඳ, සුවඳ, රස, තිත්ත හා ශබ්දය යි.
07. ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල පුවත්පත වන්නේ,
    (1) ඥානාර්ථ ප්‍රදීපය වේ. (2) ලංකා ලෝකය වේ.
    (3) සරසවි සඳරැස වේ. (4) කලම්බු ජ්නලය වේ.
08. පුවත්පතක සාහිත්‍යය පිටුව සැකසීමට සෘජු ලෙසම දායක නොවන්නේ,
    (1) විශේෂාංග කතෘ ය (2) චිත්‍ර ශිල්පියාය
    (3) ප්‍රවෘත්ති කතෘ ය (4) සෝදුපත් කියවන්නා ය.
09. පහත දෑ අතුරෙන් ප්‍රවෘත්ති මූලාශ්‍රයක් නොවන්නේ,
    (1) ප්‍රවෘත්ති සාකච්ඡා ය. (2) ප්‍රවෘත්ති ඒජන්සි ය.
    (3) ප්‍රවෘත්ති ඡායාරූප ය. (4) ප්‍රවෘත්ති නිවේදන ය.
10. ගමෙහි යටිතල පහසුකම් වර්ධනය කිරීමේ අරමුණින් පවත්වනු ලබන ග්‍රාම සංවර්ධන සමිති රැස්වීම අයත් වන්නේ,
    (1) විධිමත් සන්නිවේදනයට ය. (2) අවිධිමත් සන්නිවේදනයට ය.
    (3) කාර්ය බද්ධ සන්නිවේදනයට ය. (4) පුද්ගලාන්තර සන්නිවේදනයට ය.
11. පහත ආයතන අතුරෙන් රජයට කොටස් හිමි සමාගමක් නොවන්නේ,
    (1) ලක්හඬ ගුවන් විදුලි සේවාව යි. (2) ස්වාධීන රූපවාහිනි සේවාව යි.
    (3) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව යි. (4) ලේක් හවුස් ආයතනය යි.

12. යම් වාණිජ ආයතනයක් ගුවන් විදුලි හෝ රූපවාහිනී වැඩ සටහනක් සඳහා අනුග්‍රහය දැක්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
(1) ග්‍රාහකයාට අවශ්‍ය තොරතුරු ලබා දීමයි.
(2) විනෝදාස්වාදය සම්පාදනය යි.
(3) ප්‍රචාරාත්මක වාසියක් සලසා ගැනීමයි.
(4) වැඩි ග්‍රාහක පිරිසක් දැනුවත් කිරීමයි.

13. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ආරම්භ වන්නේ,
(1) පෘතුගීසි පාලන සමයේ දී ය. (2) ඉංග්‍රීසි පාලන සමයේ දී ය.
(3) ලන්දේසි පාලන සමයේ දී ය. (4) පශ්චාත් යටත් විජිත සමයේ දී ය.

14. පරිගණක අකුරු සැකසීම, පිටු සැලසුම් හා ඡායාරූප සංස්කරණය මූලික අවශ්‍යතාවක් වන්නේ,
(1) ලෙටර්ප්‍රෙස් මුද්‍රණයේ දී ය. (2) පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දී ය.
(3) ස්ක්‍රීන් මුද්‍රණයේ දී ය. (4) ලිතෝග්‍රැෆි මුද්‍රණයේ දී ය.

15. දිනපතා පුවත්පතක මුල් පිටුවේ බොහෝ විට ඇතුළත් වන්නේ,
(1) රාජ්‍ය ප්‍රවෘත්ති ය. (2) දෘඪ ප්‍රවෘත්ති ය.
(3) නිල ප්‍රවෘත්ති ය. (4) මෘදු ප්‍රවෘත්ති ය.

16. යම් සිනමා පටයක් හෝ රූපවාහිනි වැඩ සටහනක් උසස් රූපාවලියකින් යුක්ත යැයි නිගමනය කරන්නේ,
(1) දෘශ්‍ය භාෂාව මැනවින් යොදාගෙන ඇති නිසාය.
(2) රූප පෙළ සදාචාරාත්මක නිසාය.
(3) විනෝදාත්මක අන්තර්ගතයකින් යුක්ත වන නිසාය.
(4) සෙසු දෘශ්‍ය නිර්මාණ හා සැසඳීමෙනි.

17. පුවත්පතක ප්‍රාදේශීය ප්‍රවෘත්ති වාර්තාවක් සංස්කරණය කිරීමේ වගකීම පැවරෙන්නේ,
(1) ප්‍රාදේශීය ප්‍රවෘත්ති සංස්කාරකටය (2) ප්‍රධාන සංස්කාරකටය
(3) උප සංස්කාරකටය. (4) ප්‍රවෘත්ති සංස්කාරකටය.

18. ගුවන් විදුලි ප්‍රවෘත්ති පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.
A - ගුවන් විදුලි ප්‍රවෘත්ති විස්තරාත්මකව ඉදිරිපත් කළ හැකිය.
B - සංඛ්‍යා හා ඉලක්කම් විශේෂයෙන් ඇතුළත් කළ යුතුය.
C - සෙසු මාධ්‍ය වලට සාපේක්ෂව ක්ෂණිකව ඉදිරිපත් කළ හැකිය.
D - සරල හා කෙටි වාක්‍ය යොදාගත යුතුය.

මේ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශ වන්නේ,
(1) B හා C ය. (2) C හා D ය. (3) B හා D ය. (4) A හා B ය.

19. ලේඛනයක් ඡායාපිටපත් කිරීමේ දී තීන්ත තැවරීම නිසා එහි සඳහන් දෑ කියවා ගත නොහැකි විය. මෙය,
(1) අර්ථ බාධකයකි. (2) දෘශ්‍ය බාධකයකි.
(3) යාන්ත්‍රික බාධකයකි. (4) මාධ්‍ය බාධකයකි.

20. එක්තරා ප්‍රවෘත්ති සාකච්ඡාවකට අදාළව පළවූ ඡායාරූපයක් තමාගේ නොවන බව එයට සහභාගි වූ පුද්ගලයෙක් පුවත්පත් සංස්කාරකට දක්වා තිබුණි. මෙවැනි අවස්ථාවක ආචාරධර්ම අනුව ගත යුතු පියවර වන්නේ,
(1) ඡායාරූපය නොමැතිව නැවත ප්‍රවෘත්ති සාකච්ඡාව පළකිරීමයි.
(2) මින් ඉදිරියට එසේ නොවන බවට පොරොන්දු වීමයි.
(3) ලිපිය සැකසූ සංස්කාරකවරයාගේ වැඩ තහනම් කිරීමයි.
(4) සමාව ඉල්ලීම හා නිවැරදි කිරීමේ ලිපියක් පළකිරීමයි.

21. පුවත්පත්වල පළවූ ප්‍රවෘත්ති අතුරෙන් වැඩිම කැමැත්තක් ඇති ප්‍රවෘත්තිය තෝරාගැනීමට යොදා ගත හැකි වඩාත් ගැලපෙන විධික්‍රමය වන්නේ,
(1) ප්‍රශ්නාවලි ක්‍රමය යි. (2) අන්තර්ගත විශ්ලේෂණය යි.
(3) බෙදාහරින්නන් සමඟ සම්මුඛ සාකච්ඡාව යි. (4) නිරීක්ෂණය යි.

22. රූපවාහිනී සංවාදයක් නැරඹූ බොහෝ දෙනාගේ අදහස වූයේ එය ඒකපාර්ශ්වික සංවාදයක් වූ බවයි. ජනමාධ්‍යයක් වශයෙන් රූපවාහිනියේ වගකීම වන්නේ,
(1) තමන් දරණ මතයට වැඩි ඉඩක් දීමය
(2) ජනතාවට මතවාදී මණ්ඩපයක් සකසා දීමය.
(3) විරුද්ධ මත ඛණ්ඩනය වන ලෙස සංවාදය මෙහෙයවීමය.
(4) සංවාදය මෙහෙයවන්නන්ගේ මතය ජනතාව අතරට ගෙන යාමය.

23. තමන් කියවමින් සිටි පොත ඉතා වැදගත් යැයි සිතන අමරා පොත සම්පූර්ණයෙන්ම ඡායා පිටපත් කරගන්නා ලදී. ඇයගේ ක්‍රියාව,
   (1) කතෘගේ සදාචාරාත්මක අයිතිය උල්ලංඝනය කරන නිසා වරදකි.
   (2) ශාස්ත්‍රීය කටයුත්තක් නිසා සාධාරණ භාවිතය යටතේ වරදක් නොවේ.
   (3) කෘතියේ හිමිකරුගේ ආර්ථික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.
   (4) තොරතුරු ලැබීමට ඇති අයිතිය යටතේ වරදක් නොවේ.
24. සිනමා හෝ රූපවාහිනී කෘතියක පසුබිම් සංගීතය මගින් ඉටු කෙරෙන්නේ,
   (1) දර්ශනයේ පාළුව මැකීම යි.
   (2) දර්ශනයේ අර්ථය මතු කිරීම යි.
   (3) රූපය ඉක්මවා නව අරුත් මතුකිරීම යි.
   (4) දර්ශනය කෙරේ ප්‍රේක්ෂකයා බැඳ තැබීමයි.
25. තම පාසල පිළිබඳ වාර්තා චිත්‍රපටයක් සකස් කිරීමට ශිෂ්‍ය කණ්ඩායමක් සූදානම් වේ. පහත දැක්වෙන්නේ එයට නියමිත රූපරාමු කිහිපයකි.

   A - ශිෂ්‍යයෙකුගේ සිනාසෙන මුහුණ
   B - විදුහල්පතිතුමාගේ සාකච්ඡාවක්
   C - පාසලේ සමස්ථ දර්ශනයක්
   D - ගුරුවරයෙක් කළු ලෑල්ලක ලියන අයුරු

   ඉහත රූපරාමුවල අනුපිළිවෙළ වන්නේ,
   (1) සමීප රූපයක්, මධ්‍යම රූපයක්, දුර රූපයක්, අති දුර රූපයක්
   (2) සමීප රූපයක්, මධ්‍යම රූපයක්, අති දුර රූපයක්, දුර රූපයක්
   (3) දුර රූපයක්, මධ්‍යම රූපයක්, සමීප රූපයක්, අති දුර රූපයක්
   (4) මධ්‍යම රූපයක්, දුර රූපයක්, සමීප රූපයක්, අතිදුර රූපයක්
26. පුවත්පතක සංස්කාරක මණ්ඩලයට අයත් වන්නේ,
   (1) ප්‍රධාන සංස්කාරක, උප සංස්කාරක, ඡායාරූප ශිල්පීන් සහ පිටු සැලසුම් ශිල්පීන් ය.
   (2) නියෝජ්‍ය සංස්කාරක, විචිත්‍රාංග ලේඛකයින්, දැන්වීම් කළමණාකරු සහ මාණ්ඩලික වාර්තාකරුවන් ය.
   (3) ප්‍රධාන සංස්කාරක, දැන්වීම් කළමණාකරු, මුද්‍රණ කළමණාකරු සහ බෙදාහැරීම් කළමණාකරු ය.
   (4) අධ්‍යක්ෂ, ප්‍රධාන සංස්කාරක, උප සංස්කාරක සහ මාණ්ඩලික වාර්තාකරුවන් ය.
27. ලෝක සිනමාවේ හාස්‍ය උත්පාදනය කළ විශිෂ්ට සිනමා වේදියෙකු සහ රංගන ශිල්පියෙකු ලෙස චාලි චැප්ලින් ඉමහත් සම්භාවනාවට පාත්‍ර වේ. ඊට හේතුව ඔහුගේ කෘති මගින්,
   (1) ඕනෑම පුද්ගලයෙකු සිනහ ගැන්වීමට සමත් වීමය.
   (2) ඉමහත් ධනයක් ඉපයීමට සමත් වීමයි.
   (3) හාස්‍ය උත්පාදක කෘති වලට පූර්වාදර්ශයක් වීමයි.
   (4) මිනිසාගේ චිත්ත අභ්‍යන්තරය විවර කර පෙන්වීමට සමත් වීමයි.
28. ප්‍රවෘත්ති හා තොරතුරු ලබා දීමේ දී අනෙක් මාධ්‍ය වලට නොමැති බලයක් රූපවාහිනියට තිබේ. ඊට හේතුවක් නොවිය හැක්කේ, රූපවාහිනිය,
   (1) ක්ෂණික මාධ්‍යයක් වීමයි.
   (2) සජීවිකරණයේ ප්‍රභල මාධ්‍යයක් වීමයි.
   (3) සුහදශීලීව ආමන්ත්‍රණය කළ හැකි මාධ්‍යයක් වීමයි.
   (4) වෙනත් කාර්යයක් කරන අතරෙහි නැරඹිය හැකි මාධ්‍යයක් වීමයි.
29. ප්‍රංශ ජාතික ජෝශප් නිසපෝර් නීප්සේ යනු, ලෝකයේ
   (1) මිනිසෙකු ඡායාරූපගත කළ ප්‍රථම පුද්ගලයා ය.
   (2) සෘණ ඵලකය සොයාගත් විද්‍යාඥයා ය.
   (3) ප්‍රථම ඡායාරූපයේ නිර්මාපකයා ය.
   (4) සිනමා කැමරාව නිපදවූ තැනැත්තා ය.
30. එක්තරා දේශකයෙකුගේ දේශනයක පිටපතක් වෙනත් දේශකයෙක් විසින් පිටපත් මුද්‍රණය කර අලෙවි කර තිබුණි. එමගින් සිදුවී ඇති වරද හා සම්බන්ධ නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
   (1) පළමු දේශකයාගේ ආර්ථික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත.
   (2) පළමු දේශකයාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත.
   (3) බුද්ධිමය දේපල අනවසරයෙන් භාවිතා කර ඇත.
   (4) පළමු දේශකයාගේ ප්‍රකාශන හිමිකම් උල්ලංඝනය වී ඇත.

31. ජනමාධ්‍යයේ අහිතකර බලපෑම් වලට එරෙහිව ඔබ පාසලේ ක්‍රියාමාර්ග වන්නේ,
   (1) ලිඛිතව දැනුම් දීම, පාසල් සිසුන් දැනුවත් කිරීම හා ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කිරීම ය.
   (2) පා ගමනක් සංවිධානය කිරීම, උද්ඝෝෂණයක් පැවැත්වීම, ලිඛිතව දැනුම් දීමය.
   (3) උද්ඝෝෂණයක් පැවැත්වීම, අදාළ ජනමාධ්‍ය වර්ජනය කිරීමට පෙළඹවීම, ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කිරීමය. රැලියක් සංවිධානය කිරීමය.
   (4) පාසල් සිසුන් දැනුවත් කිරීම, ලිඛිතව දැනුම් දීම, විරෝධතා රැලියක් සංවිධානය කිරීම ය.

32. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම යනු,
   (1) පුවත්පත් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කරන රාජ්‍ය ආයතනයකි.
   (2) පුවත්පත් ප්‍රකාශනය සඳහා අවසර ලබාගත යුතු ආයතනයකි.
   (3) මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සඳහා ආචාර ධර්ම පනවන ආයතනයකි.
   (4) පුවත්පත් කර්මාන්තය හා සම්බන්ධ ස්වයං නියාමන ආයතනය කි.

33. පුද්ගලයෙකුගේ මාධ්‍ය භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A - ඔහු තම සමීප මිතුරන් සමඟ පමණක් මාධ්‍ය පිළිබඳ අදහස් හුවමාරු කර ගනී.
   B - ඔහුට ජනමාධ්‍ය අන්තර්ගතය පිළිබඳ ඉහළ දැනුමක් ඇත.
   C - ඔහු ජනමාධ්‍ය ආයතනවලට සෘජුව කරුණු ඉදිරිපත් කරයි.
   D - ඔහුට ජනමාධ්‍ය පිළිබඳ විමර්ශනාත්මක දැක්මක් තිබේ.

   ඉහත තොරතුරු වලින් සක්‍රීය ග්‍රාහකයෙකුගේ ලක්ෂණ වන්නේ,
   (1) A, B හා C වේ.   (2) A, B හා D වේ
   (3) B, C හා D වේ.   (4) A, B, C හා D වේ.

34. විකේතිකරය යනු පණිවිඩය
   (1) සම්ප්‍රේෂණය කරන්නා ය.   (2) අර්ථකථනය කරන්නා ය.
   (3) පෝෂණය කරන්නා ය.   (4) ප්‍රතිග්‍රාහණය කරන්නාය.

35. පෝස්ටර් මාධ්‍ය පිළිබඳ සාකච්ඡාවක දී මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
   A - ආකර්ශණීයව සංදේශයක් ඉදිරිපත් කළ හැකිය.
   B - වැදගත් තොරතුරු කෙටියෙන් දැක්විය හැකිය.
   C - විශාල පිරිසකට එකම අවස්ථාවක තොරතුරු දැනුම් දිය හැකිය.
   D - සෑම විටම සන්නිවේදකයා පැහැදිලිව හඳුනාගත හැකිය.
   E - කාලගුණික සාධක මත සංදේශයට බාධා මතුවිය හැකිය.

   මින් පෝස්ටර් මාධ්‍ය හා වඩාත් ගැලපෙන්නේ,
   (1) A, B හා C ය.   (2) A, B, හා D ය.
   (3) A, B හා E ය.   (4) B, C, හා D ය.

36. සන්නිවේදනයෙහි කාර්යයන් පිළිබඳ නොගැලපෙන යෙදුමක් සහිත කාණ්ඩය තෝරන්න.
   (1) තොරතුරු සම්පාදනය, විනෝදාස්වාදය, සංස්කෘතික ප්‍රවර්ධනය
   (2) සමාජානුයෝජනය, තොරතුරු සම්පාදනය, මාධ්‍ය සාක්ෂරතාව
   (3) විනෝදාස්වාදය, සමාජානුයෝජනය, පෙළඹවීම
   (4) සමාජ ඒකාබද්ධතාව, පෙළඹවීම, විනෝදාස්වාද සම්පාදනය

37. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රජා ගුවන්විදුලියක් වන්නේ,
   (1) ඌව   (2) වයඹ   (3) රජරට   (4)යාපනය

38. සන්නිවේදන ක්‍රියාවලියෙහි අන්තර්ගතය ලෙස සැලකෙන්නේ,
   (1) සන්දර්භය යි.   (2) බලපෑමයි   (3) නාලිකාවයි   (4)පණිවිඩයයි

39. A - ක්‍රීඩා තරග විස්තර විචාරයක්
   B - මැතිවරණ ප්‍රතිඵල විකාශයක්
   D - ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශයක්

   ඉහත වැඩසටහන් අතුරෙන් ගුවන්විදුලි සජීවී වැඩසටහන් වලට අයත් වන්නේ,
   (1) A හා B ය.   (2) A හා C ය.   (3) B හා C ය.
   (4) A, B හා C යන සියල්ලමය.

40. පුවත්පත් ඡායාරූප පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක් වේ.
   A - සාක්ෂරතාවයෙන් තොර අයට වැදගත් වේ.
   B - පුවත්පතක විශ්වසනීයත්වය වැඩි වේ.
   C - පුවත්පතට ආකර්ශණීය පෙනුමක් ලැබේ.

   ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
   (1) A හා B පමණි.   (2) A හා C පමණි
   (3) B හා C පමණි.   (4) A, B හා C යන සියල්ලමය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමුවන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. ගැමුණු විද්‍යාලයේ මෙවර මාධ්‍ය දිනය වෙනුවෙන් අන්තර් පාඨශාලයීය මාධ්‍ය තරගාවලියක් සංවිධානය කරන ලදී. මාධ්‍ය අනුග්‍රහය ජය FM සේවය මගින් ලබා දුනි.

    (1) ගැමුණු විද්‍යාලය මගින් මෙම තරගය සඳහා ජය FM සේවයට ආරාධනා කිරීම පාදක කරගනිමින් සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග 04 ක් ඉදිරිපත් කරන්න.

    (2) ඉහත (1) හි සඳහන් අංග වලට අදාළව සිදුවීමෙහි මූලික අවස්ථා 04 ක් ඉදිරිපත් කරන්න.

    (3) සියළුම තරග සඳහා අදාළ නීති රීති ලිඛිතව තරගකරුවන් වෙත ලබාදෙන ලදී. ලිඛිත සන්නිවේදනයේ ප්‍රයෝජන 02 ක් ලියන්න.

    (4) මාධ්‍ය දිනය උත්සවාකාරයෙන් ආරම්භ විය. මෙහි විශේෂ අවස්ථා පසුව දැකබලා ගතහැකි ක්‍රමවේද 02 ක් සඳහන් කරන්න.

    (5) ජය FM සේවය අයත් වන්නේ කුමන සන්නිවේදන ස්වරූපයකට ද?

    (6) ප්‍රවෘත්ති සංස්කරණය ද එක් තරග ඉසව්වක් විය. ජනමාධ්‍ය ආයතන වල එම කාර්යයයේ නිරත වන්නන් හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

    (7) ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ විස්තර ඇතුළත් මුද්‍රිත පිටපතක් සිසුන්ට බෙදාදෙන ලදී. පසුව වෙතත් පුද්ගලයෙකු විසින් එය එලෙසින්ම පිටපත් කර අළෙවිකනර ඇත. එම පුද්ගලයා විසින් සිදුකළ වරද කුමක් ද?

    (8) නිවේදන තරගය සඳහා සහභාගි වූ තරගකරුවන් සම්බන්ධ වී සිටින සන්නිවේදන ස්වරූපය කුමක් ද?

    (9) නිවේදන තරගයේ ජයග්‍රහකයාට ජය FM සේවයේ වැඩසටහනක පසුබිම් කථනය සඳහා අවස්ථාව ලබාදෙන බව පැමිණි මාධ්‍යවේදියෙක් පැවසීය. එවැන්නකු සතුවිය යුතු මූලික කුසලතා 02 ක් නම් කරන්න.

    (10) මාධ්‍ය තරගාවලිය පිළිබඳ ප්‍රවෘත්ති වාර්තාවක් සකස් කරන්නේ නම්, එහි මූල පාඨයේ ඇතුලත් කිරීමට අදහස් කරන ප්‍රධාන කරුණු 04 ක් නම් කරන්න.

02. (1) අනෙකුත් ජනමාධ්‍යයන් හා සසඳා බලන විට ගුවන් විදුලි මාධ්‍ය සතු සුවිශේෂී ගුණාංගය කුමක් ද?

    (2) ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදකවරයෙකු සතු කාර්යයන් 04 ක් ලියන්න.

    (3) අනෙකුත් මාධ්‍ය හා සසඳා බලන විට ගුවන් විදුලි මාධ්‍ය සතු ලක්ෂණ 04 ක් ලියන්න.

03. (1) අන්තර්ජාතික ප්‍රවෘත්ති ආයතන 02 ක් නම් කරන්න.

    (2) දේශීය ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී උපයෝගී කරගන්නා ප්‍රවෘත්ති මූලාශ්‍ර 04 ක් දක්වා ඉන් 01 ක් කෙටියෙන් හඳුන්වන්න.

    (3) ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී තොරතුරු වල වැදගත්කම අනුව අවරෝහණ ක්‍රමයට පෙළගැස්වීම කෙසේ හඳුන්වන්නේ දැයි දක්වා එය පැහැදිලි කිරීමට රූපසටහනක් අඳින්න. පැහැදිලි කරන්න.

04. (1) සෙවනැලි රූප බිත්තියක් මත පතිත කරවීම සඳහා කාලාන්තරයකට පෙර මිනිසා භාවිතා කළ උපකරණයේ නම කුමක්ද?

    (2) ශ්‍රමායික කැමරාවක් භාවිතයට වඩා ඩිජිටල් කැමරාවක් භාවිතයෙන් ඡායාරූප ලබාගැනීමේ වාසි 02 ක් දක්වා ඒවා පැහැදිලි කරන්න.

    (3) ඡායාරූපයක ක්ෂේත්‍ර ගැඹුර යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

05. (1) අන්තර්ජාලය සෙසු මාධ්‍යයන්ගෙන් වෙනස් වන ආකාර 02 ක් නම් කරන්න.

    (2) ඔබ පාසලේ පාසල් වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට සැලසුම් කරන්නේ නම්, ඊට ඇතුළත් විය යුතු අංග 04 ක් දක්වන්න.

    (3) විදෙස්ගතව සිටින ඔබ පවුලේ සාමාජිකයෙක් සමග අන්තර්ජාලය ඔස්සේ ලිඛිත සම්බන්ධතාවක් පවත්වන්නේ නම් එම ක්‍රමයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 04 ක් පැහැදිලි කරන්න.

06. (1) මාර්ගවල ධාවනය වන රථවාහන නිරීක්ෂණයට සවිකර ඇති කැමරා පද්ධති හඳුන්වන නම කුමක් ද?

    (2) වාර්තාමය චිත්‍රපටයක ලක්ෂණ 04 ක් දක්වා ඉන් 01 ක් පැහැදිලි කරන්න.

    (3) ''සිනමාව යනු අධ්‍යක්ෂවරයාගේ මාධ්‍යයයි.'' ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? පිළිතුරට හේතු 04ක් ලියන්න.

07. (1) ඔබ පාසලේ සිසුන්ගේ පුවත්පත් කියවීමේ රටාව පිළිබඳ සමීක්ෂණයක දී දත්ත රැස්කර ගත හැකි ක්‍රම 02 ක් ලියන්න.

    (2) විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු මූලික ගුණාංග 04 ක් දක්වන්න.

    (3) ජනමාධ්‍ය විසින් ළමයා මත ඇති කරන ධනාත්මක බලපෑම් 02 ක් දක්වා ඒවා පැහැදිලි කරන්න.